# පැරණි ලක්දිව අධ්‍යාපනයඃ පන්සල හා පිරිවෙන ආශ්‍රිතව සිදුකෙරෙන ඓතිහාසික අධ්‍යයනයක්

එස්. කේ. රණසිංහ[1]

මිහිඳු මාහිමියන්ගේ ආගමනයත් සමගින් මෙරටට බුද්ධාගම හැරුණවිට රටවැසියන්ගේ බුද්ධි කෞශල්‍යය වර්ධනය කරනු සඳහා අධ්‍යාපන ක්‍රම ද වෙනත් සාහිත්‍යය කලා ශිල්ප පිළිබඳ දැනුම ද ප්‍රචලිත විය. ඒ ඔස්සේ දැනුම ලබාගැනීමේ බහුවිධ ක්‍රමවේද බිහිවියග අධ්‍යාපනය වනාහි දැනුම සොයා යෑමේ එක් ක්‍රමවේදයකි. පැරණි ලක්දිව පොදුවේ බොහෝ දෙනෙක් ශිල්ප ශාස්ත්‍ර හදාරන එක ම විද්‍යා ස්ථානය බවට පන්සල පත්විය. එය එක් අධ්‍යාපන ක්‍රමවේදයක් වන අතර අනෙක් සම්භාවිත අධ්‍යාපනය ක්‍රමය නම් පිරිවෙන් අධ්‍යාපනය යි. රාජකීය දරුවන් මෙන් ම සාමාන්‍ය රට වැසියන්ගේ දරුවන් ද ශිල්ප ශාස්ත්‍ර. අධ්‍යාපනය ළබාගන්නා ලද්දේ පන්සලෙනි. ඔවුන් භික්ෂූන් වහන්සේලාට විවේක ඇති වේලාවන් හි දී විහාරස්ථානවලට ගොස් පෞද්ගලිකව ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වූහ. පැරණි ලක්දිව පිරිවෙන් වශයෙන් සලකන ලද්දේ එක් භික්ෂුවකට හෝ කිහිපදෙනෙකුට වැඩසිටිය හැකි කුඩා කුටි විශේෂයකට ය. කාලපාසාද පිරිවෙණ සුණාත පිරිවෙණ දීඝචංකමන පිරිවෙණ එලග්ග මරුගන පිරිවෙණ ආදි නම් වලින් හඳුන්වනු ලැබූ ගොඩනැගිලි කීපයක් ද අනුරාධපුර යුගයේ පැවතී ඇත. මෙම කුඩා පිරිවෙන් තුළ යම් ධර්ම කොට්ඨාස පිළිබඳ පුළුල් අවබෝධයක් වූ උගත් බුද්ධිමත් ආචාර්යයන් වහන්සේලා වැඩ සිට ඇත. මෙම පිරිවෙන්වලට අමතරව දිවයින පුරා ම ප්‍රාදේශික පිරිවෙන් ද දහස් ගණනක් පැවතී ඇතග පිරිවෙන්වල ඉගැන්වූ අධ්‍යාපන විෂය මාලාවට අක්ෂර විද්‍යාවල සූත්‍ර, විනය අභිධර්ම සමයාන්තර ධර්ම දෙමළ වේද වේදාංග වෛද්‍ය ශාස්ත්‍ර ජ්‍යෝතීර් විද්‍යා නක්ෂත්‍ර විද්‍යා භූතවිද්‍යා ඡන්දෝලංකාර කාව්‍ය නාටක භාෂා සාහිත්‍යය ඉතිහාසය පුරාවිද්‍යාව අර්ථශාස්ත්‍ර චිත්‍ර කර්ම ලලිතකලා පමණක් නොව යුධ ශිල්ප ධනු ශිල්ප කඩු ශිල්ප කරාටේ ජූඩෝ වැනි සටන් ක්‍රම ද විය.

මෙහි ලා සාහිත්‍යය මූලාශ්‍රය මෙන්ම පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ද අනුසාරයෙන් තුලනාත්මක අධ්‍යයනයක් සිදුකළ අතර පන්සලෙන් සහ පිරිවෙනෙන් ළබා දුන් අධ්‍යාපනයෙන් ආපේක්ෂා කළ මානව ශික්ෂණය නිසියාකාරව ලැබුනේද එසේ ලැබුනේනම් එය කිනම් ආකාරයකට ද යන්න සොයා බැලිණ. පන්සලෙන් හා පිරිවෙනෙන් ලද අධ්‍යාපනය මගින් අධ්‍යාත්මික ගුණවගාව හා චරිත ශෝධනයට මුල් තැන දී ඇති අතර එකී අධ්‍යාපනය ලද ශිෂ්‍යයා ඇනුමෙන් තමාට මෙන්ම රටටත්ල ජාතියටත් ආගමටත් සේවය කිරීමේ පරම අධිෂ්ඨානයකින් බැඳුනෙක් වෙයි. බාහිර සුබ විහරණය හා අලංකාරයට වඩා අධ්‍යාත්මික ගුණ වගාවට හා ශික්ෂණයට සමීපස්ථ බවක් දනවන අංගුත්තර භාණක මජ්ඣිම භාණක ත්‍රිපිටකවාගීශ්වර ත්‍රිපිටකවාගීශ්වරාචරිය සක කලා සර්වඥ ෂඩ්භාෂා පරමේශ්වර රාජගුරු ආදි ආගමික උපාධි ද ගිහියන් සඳහා පණ්ඩිතල කලිකාල සාහිත්‍යයල සර්වඥ පණ්ඩිතල පරාක්‍රම පණ්ඩිත බෞද්ධාගම චක්‍රවර්ති සකලකලාවල්ලභ ආගම චක්‍රවර්ති අග්‍ර පණ්ඩිත සකලකලා සාහිත්‍ය පණ්ඩිත වැනි උපාධි ද මෙම පිරිවෙන් ඔස්සේ පිරිනමා ඇත. පන්සල හා

1 ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය,
Email: shyamiuni_stas@yahoo.com

පිරිවෙන ආශ්‍රිතව මෙසේ ගොඩනැගෙන අධ්‍යාපන ක්‍රමවේද ඔස්සේ ලෞකික සහ අධ්‍යාත්මික සංකල්පයෙහි ඒකාබද්ධතාව සමගින් සමාජයේ උපාංගයක් වූ ලෞකික අධිකාරීත්වය නිසි මගට යොමුකරලීමට අවශ්‍ය කායික හා මානසික ශික්ෂණය නිතැනින් ම සැකසීමට උපකාර වී ඇති බව මෙනයින් අනාවරණය කර ගත හැකි විය.

**ප්‍රමුඛ පද:** පැරණි ලක්දිව, පන්සල, පිරිවෙන, අධ්‍යාපන ක්‍රමවේදය